# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010**
**2012 ජනවාරි / පෙබරවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

**බෞද්ධ සංස්කෘතිය - BUCU E 2015**

**බෞද්ධ කලා, පුරාවස්තු හා භික්ෂු භික්ෂුණී සංස්ථා**

**කොටස් දෙකෙන් ම ඇතුලත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** **කාලය : පැය 03 යි**

---

### 1 කොටස

01. ආරාම මූලික සංඝ සමාජයක් ආරම්භ වීමට පදනම් වූ ඓතිහාසික සිද්ධි හා අවස්ථා පිළිබඳ විමසීමක් කරන්න.

02. ස්වදේශීය බුද්ධ ප්‍රතිමා කලාව මථුරා සම්ප්‍රදාය ඇසුරින් සංවර්ධනය වූ ආකාරය සනිදර්ශිතව දක්වන්න.

03. භාරතීය ස්තූප ආශ්‍රිත රූකම් කලාවේ බෞද්ධ තේමාවන් අදාළ ස්ථාන ඇසුරින් විමර්ශනය කරන්න.

04. ලක්දිව බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳ මූලාශ්‍රමය තොරතුරු කෙටියෙන් දක්වා අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමාවේ සුවිශේෂත්වය ප්‍රකට කරන්න.

05. පටිමාඝර පිළිබඳ හැඳින්වීමක් කොට පොළොන්නරු යුගයේ ගෙඩිගේ විහාර නිර්මාණයන්හි වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක ලක්ෂණ අගයන්න.

### 11 කොටස

06. ක්‍රි. පූ. හයවන සියවසේ භාරතයේ සිටි විවිධ ශ්‍රමණ කණ්ඩායම් අතර බුද්ධශ්‍රාවක වූ පැවිද්දන්ගේ සුවිශේෂත්වය ත්‍රිපිටකය ඇසුරින් පෙන්වා දෙන්න.

07. "එහි භික්ඛු" පැවිදි උපසම්පදා ක්‍රමයේ දාර්ශනික අර්ථය පැහැදිලි කොට පැවිදි උපසදම්පදා කිරීමේ බලය විමධ්‍යගත කිරීම භික්ෂු සමාජයේ සංවර්ධනයට හේතු වූ ආකාරය සමාලෝචනය කරන්න.

08. ''සාම්ප්‍රදායික පිළිගැනීම් ප්‍රතික්ෂේප නොකොට කාන්තා නිදහස උපරිම අයුරින් ආරක්ෂාකර දීමට බුදුරදුන් උත්සහාගත් ආකාරය භික්ෂුණී සමාජය ආරම්භ කිරීමෙන් මනාව පැහැදිලි වේ.'' සාකච්ඡා කරන්න.

09. විනය පිටකයෙහි සඳහන් සංඝ කර්ම පිළිබඳ හැඳින්වීමක් කොට එහි ජනසම්මතවාදී ලක්ෂණ පෙන්වා දෙන්න.

10. මාතෘකා <u>දෙකකට (02)</u> ප්‍රමාණවත් විස්තර සපයන්න.

1. මහාප්‍රජාපති ගෝතමී
2. ආභිසමාචාරික ශික්ෂා
3. ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව
4. අභව්‍ය හා අයෝග්‍ය පුද්ගලයෝ

*******************************